# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2136/3 – 2019 අගෝස්තු 13 වැනි අඟහරුවාදා – 2019.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2016 සැප්තැම්බර් මස 09 වැනි දින අංක 1983/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ* ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2016 අංක 215 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් එකී ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2016/HW/119.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 3/3/22-1.
2019 ජුලි මස 11 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රැකෝපත්තු කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 854, ගොඩවිට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බඹරගහපැලැස්ස ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක අ.ග.පි. 1491 දරන මූලික පිඹුරේ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අංක 151 – හිටිනාවත්ත, පාලුවත්ත හෙවත් මීගහමුලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0333**

උතුරට: කැබලි අංක 158 සහ 145; නැගෙනහිරට: කැබලි අංක 150 සහ 19; දකුණට: කැබලි අංක 19, 34 සහ 152; බටහිරට: කැබලි අංක 152, 157 සහ 158.

08 – 962

1A – G30717 – 21 (2019/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*